නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර 01) - 2022

-----------------------------------------------------------------------------------------------------------------------

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අදියර 01) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන ආයතනය (Agence Francaise De Development) අතර 2016 ජුනි 01 දින එළඹි අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (එච්) වගන්තිය සහ 2016 මාර්තු 16 දින එළඹි අංක සීඑල්කේ 1013-02 එල් දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය පහසුකම් හා මූල්‍ය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ අප ජලය රැස්කිරීම හා පිරිපහදු පද්ධති ව්‍යාප්ත කිරීම සහ මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ 73,000 ක් වූ ජනතාවට සනීපාරක්ෂක සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා වැඩි දියුණු කිරීම, ජල හා සනීපාරක්ෂ අංශයේ ව්‍යුහය වැඩි දියුණු කිරීම හා විශ්ලේෂණය කිරීම, දරිද්‍රතාව පිටු දැකීම සඳහා අවැසි දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම මගින් වරප්‍රසාද නොලත් නිවැසියන්ට සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා සැලසීම සහ වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂාව සහ ජෛව විවිධත්ව නඩත්තුව සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම වේ. සැලසුම් සහ අධීක්ෂණ උපදේශන, මීගමුවේ සනීපාරක්ෂාව, කළමනාකරණ සහය උපදේශන යන අංග 03 යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ප්‍රංශ සංවර්ධන ආයතනය එකඟ වී තිබුණි. ඉතිරි යූරෝ මිලියන 26 ක ප්‍රමාණය ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මතය**

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| අංක 01/2019 කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 වගන්තිය. | චක්‍රලේඛයට අනුව, මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු අතර, 2017 සිට 2022 දක්වා කමිටු රැස්වීම් පහක් පමණක් පවත්වා තිබුණි. | පාස්කු ඉරිදා ප්‍රහාරය සහ කෝවිඩ් - 19 වසංගතය හේතුවෙන් නිත්‍ය මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අවසන් කිරීමට මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට කටයුතු කළ යුතුය |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘති ක්‍රියාකාරකම | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මීගමුව නගරාශ්‍රිත සනීපාරක්ෂාව | | | |
| i) | මීගමුව අපජල බැහැර කිරීමේ පද්ධතිය සඳහා පොම්පාගාරයක් සහිත එකතු කිරීමේ පද්ධතියක් ඉදිකිරීම. | මෙම ඉදිකිරීම සඳහා ලංසු ලේඛනය ප්‍රසම්පාදන කමිටුව විසින් 2022 ජනවාරි 25 දින අනුමත කර තිබුණද, ප්‍රංශ සංවර්ධන ආයතනය විසින් අරමුදල් සීමා කිරීම හේතුවෙන් ලංසු කැඳවීම අත්හිටුවන ලදී. | ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව මුදල් නොමැතිකම හේතුවෙන් ලංසු කැඳවීමේ කටයුතු අත්හිටුවා ඇත. | ව්‍යාපෘති කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව කරගෙන යාමට කටයුතු කළ යුතුය . |
| ii) | මීගමුව මලාපවහන පද්ධතිය සඳහා අපජල පවිත්‍රාගාරයක් සහ බැහැර කිරීමේ පද්ධතියක් ඉදිකිරීමේ නිර්මාණ හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව. | ලංසුකරුවන්ට ලංසු ලේඛන 2022 මාර්තු 2 දින නිකුත් කළද මුදල් නොමැතිකම හේතුවෙන් ලංසු තැබීමේ ක්‍රියාවලිය අත්හිටුවන ලදී. | ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව මුදල් නොමැතිකම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු අත්හිටුවා ඇත | ව්‍යාපෘති කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව කරගෙන යාමට කටයුතු කළ යුතුය. |
| iii) | මීගමුව මලාපවහන පද්ධතිය සඳහා පටු මාර්ගවල එකතු කිරීමේ ජාලය සහ දේපල සම්බන්ධ කිරීම. | දේපල සම්බන්ධතා සමීක්ෂණය අවසන් කර ඇතත් මුදල් නොමැතිකම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු අත්හිටුවා ඇත. | ශ්‍රී ලංකාවේ ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් ප්‍රංශ සංවර්ධන ආයතනය තවදුරටත් ණය ලබා දීම අත්හිටුවා ඇත. | ව්‍යාපෘති කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව කරගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මලාපවහන කළමනාකරණ නිපුණතා සංවර්ධන උපදේශනය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2018 නොවැම්බර් මාසයේදී ආරම්භ කිරීමට නියමිතව තිබුණද, 2022 නොවැම්බර් මාසයේදී උපකරණ කොන්ත්‍රාත්තුවක් (පැකේජය 2) පමණක් ප්‍රදානය කරන ලද අතර අනෙකුත් කොන්ත්‍රාත් ප්‍රදානය 2022 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලංසු ලේඛන සකස් කිරීමේ වගකීම ප්‍රතිපත්ති හා ආයතනික වැඩිදියුණුකිරීමේ උපදේශකයා (PIEC) සතු බැවින් මූලික ප්‍රසම්පාදන ප්‍රමාදය මලාපවාහන කළමණාකරණ කුසලතා වර්ධන උපදේශකයා (SMSDC) වැඩ ආරම්භ කිරීම ප්‍රමාද වීමට හේතු විය. ප්‍රදානය යටතේ දැනටමත් අත්සන් කර ඇති කොන්ත්‍රාත්තු 2023.12.21 තාක්ෂණික සම්පූර්ණ කිරීමේ දිනට පෙර අවසන් කිරීමට සැලසුම් කර ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | ඉඩම් අත්පත් කර ගැනීම් | ව්‍යාපෘතියේ මූලික අදියරේදීම ඉඩම් අත්පත් කර ගැනීමේ | පෞද්ගලික හිමිකරුවන්ට අයත්ව තිබූ එම ඉඩම් හිමිකරුගේ | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් |

| | | |
|---|---|---|
| කටයුතු අවසන් කළ යුතු වුවද අපජල පොම්පාගාර සහ අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් කට්ටි 12ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරාගෙන නොතිබුණි. | විරෝධය සහ මහජන විරෝධය හේතුවෙන් යම් ප්‍රමාදයක් ඇති විය. | කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති කාර්යාලය 2016 වසරේ ආරම්භ කර ඇති අතර ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ලෙස නිලධාරීන් 20 දෙනෙකු පමණ සේවය කරමින් සිටියද, ප්‍රධාන මූලික වැඩ කොන්ත්‍රාත්තු 3ක් තවමත් ප්‍රදානය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘතියේ කිසිදු කොටසක් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මෙතරම් විශාල කාර්ය මණ්ඩලයක් සහ ව්‍යාපෘති කාර්යාලයක් නඩත්තු කිරීමට වැය කර ඇති මුදල ආර්ථික නොවන බව නිරීක්ෂණය විය. | ණය ගිවිසුම 2016.06.01 දින අත්සන් කළද, නිලධාරීන් 10 දෙනෙකුගෙන් සමන්විතව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) 2017 ජනවාරි මාසයේදී (ප්‍රමාද මාස 7) ආරම්භ කරන ලදී. උපදේශන ආයතනයේ ඉදිරිපත් කිරීම් සඳහා තාක්ෂණික සහාය අවශ්‍ය වන පරිදි නිලධාරීන් සංඛ්‍යාව ක්‍රමානුකූලව වැඩි කරන ලදී. එය මූලික සහ විස්තර සැලසුම් අදියර සඳහා 2018 සහ 2021 අවසානයේ 15 සහ 17 දක්වා වැඩි කරන ලදී. | ආර්ථික නොවන වියදම් අවම කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.3** ඌණ උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| රටේ මෙම ආර්ථික අර්බුදයත් සමඟ කැපවීම් ගාස්තු නොවැළැක්විය හැකි වුවද මුදල් ලබා දීමේ ඉලක්ක සපුරා ගැනීමෙන් එය අවම කර ගත හැකිය. කෙසේ වෙතත් මහා භාණ්ඩාගාරය විසින් රු. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2011 සිට 2022 දක්වා නොගෙවූ ණය ශේෂය වෙනුවෙන් රුපියල් මිලියන 190 ක කැපකිරීම් ගාස්තු ලෙස ගෙවිය යුතු අතර මෙවැනි ගනුදෙනු රටට විශාල මූල්‍ය බරක් විය හැකිය. | ව්‍යාපෘතියේ ප්‍රමාදය හේතුවෙන් මුදල් ලබාදීම ප්‍රමාද විය. | ආර්ථික නොවන වියදම් අවම කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.4** මතභේදයට තුඩු දුන් කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|

සමාලෝචිත වර්ෂය අවසානයේ දී ලබා නොදුන් ණය සහ ප්‍රදාන ප්‍රමාණය පිළිවෙලින් සියයට 94ක් සහ 72ක් විය. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතිය මේ වසර අවසාන වන විට අවසන් කළ යුතුය. සමාලෝචිත වර්ෂය තුළ දුර්වල කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති අතර ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කළමනාකාරීත්වය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

රජය 2022 අප්‍රේල් මාසයේදී සිය ණය පැහැර හැරීම ප්‍රකාශ කළේය. ඒ අනුව, 2022 දෙසැම්බර් 20 වන දිනට මීගමුව සැලසුම් නිම කිරීමට සහ ගාල්ල/උණවටුන සඳහා ලංසු ලේඛනය සකස් කිරීම අත්හිටුවීමට සැලසුම් හා අධීක්ෂණ උපදේශක (DSC) සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී .

ඉදිරි ගෙවීම් කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි